# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2052/20 – 2018 ජනවාරි 04 වැනි බ්‍රහස්පතින්දා – 2018.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/Z/2016/22.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ඩී. ත්‍රීමාවිතාන මයා, කැටන්දොල, තල්ගස්පේ, ඇල්පිටිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක්හවුස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30 හි සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/Z/2016/22.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ඩී. ත්‍රිමාවිතාන මයා, කැටන්දොල, තල්ගස්පේ, ඇල්පිටිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක්හවුස් පටුමග, කොළඹ 15.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් විදුලි අධිකාරි තනතුරට අදාල වැටුප් පරිමානය ආයතනයේ අනෙකුත් විදුලි අධිකාරිවරුන්ට ලබා දී තිබියදී විදුලි අධිකාරී ඩී. ඩී. ත්‍රිමාවිතාන යන අයට ලබා නොදීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

01 – 539

---

මගේ අංකය: IR/COM/02/Z/2016/147.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ඩී. එම්. පී. ඩී. පෙරේරා මිය, නො. 574/2, හල්ගහදෙනිය පාර, කලපලුවාව, රාජගිරිය.
02. ජී. එච්. එම්. ආනන්ද මයා, නො. 225 ඒ 5, වලව්වත්ත, කැස්බෑව, පිලියන්දල.
03. එච්. සුනිල් පෙරේරා මයා, නො. 163/5/3, ජයගත් මාවත, හෝකන්දර උතුර, හෝකන්දර.
04. කේ. ඩී. එල්. සෝමදාස මයා, නො. 272, පලවන පටුමග, සමරකෝන් මාවත, තුම්බෝවිල, පිලියන්දල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය, අංක. 582, ගාලු පාර, ගල්කිස්ස.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62

හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී. 1 හි පී. නවරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය

2017 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/Z/2016/147.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ඩී. එම්. පී. ඩී. පෙරේරා මිය, අංක. 574/2, හල්ගහදෙනිය පාර, කලපලුවාව, රාජගිරිය.
02. ජී. එච්. එම්. ආනන්ද මයා, අංක. 225 ඒ 5, වලව්වත්ත, කැස්බෑව, පිලියන්දල.
03. එච්. සුනිල් පෙරේරා මයා, අංක. 163/5/3, ජයගත් මාවත, හෝකන්දර උතුර, හෝකන්දර.
04. කේ. ඩී. එල්. සෝමදාස මයා, අංක. 272, පලවන පටුමග, සමරකෝන් මාවත, තුම්බෝවිල, පිලියන්දල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය, අංක. 582, ගාලු පාර, ගල්කිස්ස.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ සේවය කළ ඩී. එම්. පී. ඩී. පෙරේරා, ජී. එච්. එම්. ආනන්ද, කේ. ඩී. එල්. සෝමදාස සහ එච්. සුනිල් පෙරේරා යන අයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2008.09.29 දිනැති අංක ඩීඑම්එස්/සී/අයි/පීඑස්/34 ලිපිය අනුව අදාල තනතුරෙහි නොතබා එම තනතුරට අදාල හිඟ වැටුප් හා පාරිතෝෂික මුදල් ලබා නොදීමෙන් එම සේවකයන්ට අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔවුනට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

01 – 540

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.